උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක : 26/2017

මගේ අංකය -:NP/07/10/04/34
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය,
2017.09.23.

**ප්‍රධාන ලේකම්,**
ආණ්ඩුකාර ලේකම්,
අමාත්‍යංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
**උතුරු පළාත.**

## කුසලතා පදනම මත පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරඟ විභාගය - 2017

1. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, **2013.12.11** වැනි දින අංක : 1840/34 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුගමනය කර සකස් කරන ලද උතුරු පළාත් ආණ්ඩුකාරවර විසින් අනුමත පළාත් කළමනාකරණ සහකාර සේවා ව්‍යාවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධන වලට යටත්ව **2017.12.31** දිනට පැවති පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ පුරප්පාඩුවලින් **50%** ක පුරප්පාඩු කුසලතා මත උසස් කිරීම මගින් සම්පූර්ණ කරනු ලැබේ.

2. 2016.02.25 දාතම හා 03/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් මෙම තනතුරට **MN 07/2016** වැටුප් කාණ්ඩය හිමි වන අතර, මාසික වැටුප් පරිමාණය :- රු. **41,580 - 11 X 755 - 10 X1080 = 68,425/=** වේ. එම වැටුප හිමිවනුයේ **2020.01.01** දින සිටයි . එම චක්‍රලේඛයේ උපලේඛණ 11 හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක කරන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

3. **ඇගයීම් ක්‍රමවේදය :-**
උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අභියෝග්‍යතා පරීක්ෂණයට ඉදිරිපත් වන සෑම විෂයකටම අවම ලකුණු ප්‍රමාණය 40 ක් ලබා සමත් විය යුතුයි. එම ප්‍රතිඵල මත හා පළාත් රාජ්‍ය කොමිෂන් සභාව විසින් පත් කරන මණ්ඩලය මගින් ජ්‍යෙෂ්ඨතාව හා පළපුරුද්ද පදනම් කරගෙන ලකුණු ලබා දෙන අතර සම්පූර්ණ ලකුණුවල එකතුවේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛත්වය තීරණය කරනු ලැබේ. එම මණ්ඩලය මගින් ලකුණු ලබා දීම සඳහා තෝරා ගනු ලබන්නේ ඉහත සඳහන් පරිදි සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත් අපේක්ෂකයන් පමණයි. උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන මණ්ඩලයක් ඉදිරියේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්‍ෂණයකට අයැදුම්කරුවන් පෙනී සිටිය යුතුය. එම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දෙනු නොලැබේ.

| | **ලකුණු** |
|---|---|
| • අභියෝගතාව සහ විෂය අධ්‍යයනය (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 1 1/2) |
| • ජ්‍යෙෂ්ඨත්වය | 60 |
| • පළපුරුද්ද | 40 |
| | 200 |

### 3.1 අභියෝගතාව සහ විෂය අධ්‍යයනය - ලිඛිත පරීක්ෂණය (කාලය පැය 1 ½ ලකුණු 100)

මෙම පරීක්ෂණය පවත්වනු ලබන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙනු ඇත.අභියෝගතාව සහ විෂය අධ්‍යයනය වෙනුවෙන් වන ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

**(අ). පළමුවන කොටස (ලකුණු 40යි) :-**

සියලුම ප්‍රශ්න කාර්යාල පරිපාලනයට සම්බන්ධ වන අතර එහිදී සාමාන්‍ය දැනීම, තීරණය ගැනීමේ හැකියාව, තර්ක වශයෙන් නිශ්චිත විසඳීම් ලබාදීමේ හැකියාව හා කාර්යාල පරිපාලනයට සම්බන්ධ ගැටළු ඉදිරිපත් කරනු ලබයි.

**(ආ). දෙවන කොටස (ලකුණු 60යි) :-**

මෙහි දී කාර්යාල පරිපාලනයට සම්බන්ධ සිද්ධි අධ්‍යයන ගැටළුවකට අපේක්ෂකයින්හට පිළිතුරු සැපයීමට සිදු වන අතර ඡේදයක් හෝ ඡේද කිහිපයකින් යුක්ත වන පරිදි ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත.

**3.2 ජ්‍යෙෂ්ඨත්වය :-**

ජ්‍යෙෂ්ඨත්වය සඳහා ලකුණු දෙනු ලබන්නේ නිලධරයෙකු පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව එළඹෙන සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එක් වසරක් සඳහා ලකුණු 06 බැගින් ලකුණු 60ක උපරිමයක් දක්වා පමණි. මෙහිදී මාස 06කට වැඩි වර්ෂයකට අඩු සේවා කාලයක් සඳහා ලකුණු 03 බැගින් ලැබෙන අතර, හය මාසයකට අඩු කාලයක් සඳහා ලකුණු දෙනු නොලැබේ.

**3.3 පළපුරුද්ද :-**

පළාත් රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ I වන ශ්‍රේණියේ අධීක්ෂණ නිලධාරියෙකු ලෙස සේවය කළ එක් එක් අවුරුද්දක් සඳහාම සතුටුදායක සේවය සඳහා ලකුණු 02 බැගින් ලකුණු 40ක උපරිමයක් දක්වා පළපුරුද්ද සඳහා ලකුණු ලැබේ.

**සටහන :-**

උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරීක්ෂණ මණ්ඩලයක් විසින් ජ්‍යෙෂ්ඨත්වය හා පළපුරුද්ද සඳහා ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. අපේක්ෂකයන් ජ්‍යෂ්ඨත්වය හා පළපුරුද්ද සම්බන්ධයෙන් ඇතුලත් කරන ලකුණු එම නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුව පදනම් කරගෙන අගය කරනු ලැබේ. මෙහි දී අසත්‍ය තොරතුරු ඇතුලත් කර ඇති බවට එළිදරව් වුවහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් වලට යටත්ව අපේක්ෂකයාට හා එම ඉල්ලුම්පත්‍ර සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානියාට විරුද්ධව කටයුතු කරනු ලැබේ. පුද්ගලික ලිපිගොනුව මගින් තහවුරු නොකරන සුදුසුකම් වෙතොත් එම කාරණය සඳහා ලකුණු ප්‍රදානය කරනු නොලැබේ.

4. මේ සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය දෙසැම්බර් මස කොළඹදී පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

**5. සුදුසුකම් :-**

උතුරු පළාත් රාජ්‍ය කළමණාකරන සහකාර සේවයට අයත් නිලධාරීන්ට රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ අධිශ්‍රේණියට කුසලතා පදනම මත උසස් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි,

5.1 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට **(2017.10.16)** පළාත් රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම.

5.2 එදිනට **(2017.10.16)** පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**6. ඉල්ලුම් කිරීමේ ක්‍රමය:-**

(අ) ඉල්ලුම්පත්‍රය මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල වියයුතු අතර, එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ආවරණය වන පරිදි සකස් කර අපේක්ෂකයා විසින්ම සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවට ද 06 සිට 10 තෙක් දෙවන පිටුවට ද ඉතිරිය තුන්වන පිටුවවේද ආවරණය වන ලෙස සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කළ යුතුය. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 10ට අදාලව සඳහන් කරන පළපුරුද්ද සනාථ කිරීමට අදාළ ලිපිවල සහතික කරන ලද පිටපත් පළපුරුද්ද සඳහන් කරන පිළිවෙලට ඉල්ලුම්පත්‍රය සමග අමුණා එවිය යුතු අතර පසු අවස්ථාවක ඉදිරිපත් කරන ලේඛන ලකුණු ලබා දීම සඳහා සළකා බලනු නොලැබේ. ලිපි මගින් සනාථ වන සේවා කාලයන් වෙනුවෙන් පමණක් ලකුණු හිමි වනු ඇත. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත

(ආ) ලිඛිත පරීක්ෂණය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින්ට තමන් සේවයට බැඳුණ භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.ඉල්ලුම්පත්‍රය සකස් කිරීම හා සම්පූර්ණ කිරීම කල යුත්තේ තමන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන භාෂා මාධ්‍යයෙන්මය. ඉල්ලුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. සිංහල හා දෙමළ භාෂාවෙන් සකස් කරන ඉල්ලුම්පත්‍රයේ එයට අමතරව ඉංග්‍රීසියෙන් විභාගයේ නම සඳහන් කිරීම අවශ්‍ය වේ.

(ඈ) විභාගය සඳහා වන සම්පූර්ණ කළ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා / පළාත් අමාත්‍යාංශයේ ලේකම් මඟින් ලියාපදිංචි තැපෑලෙන් 2017.10.10 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කොවිල් පාර, නල්ලූර්, යාපනය."** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත් එවීමේදී ඒවා බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"පළාත් රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ අධිපන්තියට කුසලතා පදනම මත උසස් කිරීමේ විභාගය - 2017"** යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඇ) නිලධාරීන් විසින් විධිමත් ලෙස සම්පූර්ණ කර ඉදිරිපත් කරන අයැදුම්පත් තම කාර්යාලයට ලැබුණ දිනයේදීම කාර්යාලීය දින මුද්‍රාව තැබීමටත්, පළපුරුද්ද සනාථ කරන ලේඛන සහ අයැදුම්පතේ අංක 19 හි දැක්වෙන කොටසද සහතික කර, සහතික කළ දිනයද සහිතව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙරඉහතින් දක්වන ලද ලිපිනයට ලැබෙන සේ එවීමටත් දෙපාර්තමේන්තු ප්‍රධානියා/ පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කළ යුතුය.

(ඉ) සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා තාවකාලිකව මුදාහරිනු ලැබ ඇති /සේවය සඳහා ද්වීතීයනය කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අයදුම්පත් සහතික කොට ඉදිරිපත් කරන විට ඉහත උපදෙස් පිළිපැදිය යුතුය.

(ඊ) නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැති වන අයදුම්පත් පිළිබඳව ද මෙම නිවේදනයේ සඳහන් කර ඇති ලිපිනයට හැර වෙනත් අය වෙත යොමු කෙරෙන අයදුම්පත් පිළිබඳව ද පැමිණිලි සළකා බලනු නොලැබේ.

(උ) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් ලැබෙන අයදුම්පත් ලැබුණු බව, අයදුම්පත් ලද නිලධාරීන්ගේ නාම ලේඛනය උතුරු පළාත් වෙබ් අඩෙවියෙහි (www.np.gov.lk) පළ කරනු ලැබේ.

(ඌ) ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සමඟ සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර,අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳ සළකා බලනු නොලැබේ.

**7. විභාගය සඳහා අනුමැතිය :-**

(අ) ලිඛිත පරීක්ෂණය සඳහා වන ඉල්ලුම්පත් පිළිගත් සියලුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ දී එහි ශාලාධිපතිට තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. සහතික කරන ලද ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ආ) විභාගඅපේක්ෂකයන් තමන්ට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය.

(ඇ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පතෙහි පිටපතද, විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපතද අතැතිව, විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුණුම්පත් අංකය යන විස්තර සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට දැන්විය යුතු අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම ඵලදායී වනු ඇත.

(ඈ) ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්දට ප්‍රදානය කරන ලකුණු ප්‍රමාණයේ මිපූර්ණ ලකුණු ප්‍රමාණය කුසලතා අනුපිළිවෙළට සකස් කළ ප්‍රතිඵල ලේඛණය පළාත් රාජ ය සේවා කොමිෂන් සභාවේ දැන්වීම පරිදි, ලේකම් , පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උතුරු පළාත් වෙබ් වියෙහි **(www.np.gov.lk)** පළ කරනු ලැබේ

සටහන :-අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.

8. අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුණුම්පත.

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**9. සාවද්‍ය තොරතුරු සැපයීම හා දඬුවම් :-**

(අ) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීම නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසුව හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයෙකු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත් එසේත් නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රජයේ සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

**10. පත්වීම සඳහා තෝරා ගැනීම**

ජ්‍යෙෂ්ඨත්වය, පළපුරුද්ද හා ලිඛිත පරීක්ෂණයෙන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව අනුව කුසලතා අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පුරවනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව අපේක්ෂකයන් තෝරා ගනු ලැබේ. ( ලිඛිත පරීක්ෂණයෙන් අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගැනීම අනිවාර්ය වේ. ලකුණු 40 ට අඩුවෙන් ලබා ගන්නා අපෙක්ෂකයින් මෙම තනතුරට සුදුසුකම් නොලබති.)

11. විභාගයෙන් සමත් වන යම් අපේක්ෂකයෙකු එම පත්වීම පිරිනමන අවස්ථාවේදී බලපවත්වන රෙගුලාසි හා විධිවිධානයන් යටතේ පත්වීම ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සළකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ හැසිරීම් කරණකොට ගෙන හෝ පත්වීම් නොදීමේ අයිතිය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

12. සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව හෝ කිසියම් පුරප්පාඩු නොපිරවීමට තීරණය කිරීම, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණය ගැනීමටද ලේකම්, රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණ අමාත්‍යාංශ විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛය පදනම් කරගෙන කටයුතු කිරීමේ අයිතිය උතුරු පළාත් කොමිෂන් සභාවට බලය ඇත.

13. මෙම චක්‍රලේඛයේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

**“24/2017 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම චක්‍රලේඛය ප්‍රකාශයට පත් කරන ලදි.”**

**සී. ඒ. මෝහන්රාස්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
23.09.2017